සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 9 | විෂයය Subject | නාට්‍ය හා රංග කලාව | කාලය Time | පැය 1 1/2 |

## I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නාට්‍යයක තේමාව යනු,
    1. නාට්‍ය ශෛලියයි. 2. පෙළින් කියැවෙන ප්‍රධාන අදහසයි.
    3. අනුකරණයයි. 4. සමාරෝපයයි.

02. නාට්‍ය පෙළ තුළ දක්නට ලැබෙන අංගයකි.
    1. රංග විධාන 2. වේෂ භූෂණ 3. සංගීතය 4. ආලෝකකරණය

03. නාට්‍යවල ඇතුලත් ආනුශංගික අංග වේ.
    1. ආලෝකය, වේෂභූෂණ, රංග භාණ්ඩ, සංගීතය
    2. වේෂභූෂණ, රංග විධාන, සංගීතය, පසුතල නිර්මාණ
    3. වේෂභූෂණ, සංගීතය, නාට්‍යෝපකරණ, සංවාද
    4. සංගීතය, රංග භාණ්ඩ, තේමාව, සංවාද

04. ලෝකධර්මී නාට්‍යයකට නිදසුනකි,
    1. මනමේ 2. පේමතෝ ජායතී සෝකෝ
    3. කැළණි පාලම 4. මධුර ජවනිකා

05. නාට්‍යයක ගැටුම් පවතින්නේ,
    1. නළු නිළියන් අතරය. 2. නළුවා සහ ප්‍රේක්ෂකයන් අතරය.
    3. චරිත අතර ප්‍රතිවිරුද්ධ අදහස් තුළය. 4. අධ්‍යක්ෂ සහ ආනුෂාංගික ශිල්පීන් අතර ය.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| 06. | නාට්‍ය ප්‍රේක්ෂකයා වෙත ගෙනයන මාධ්‍යය | i. සමාරෝපය |
| 07. | නළුවා චරිතයකට ආවේෂ වීම | ii. භූමිකා |
| 08. | යම් ක්‍රියාවක් හෝ හැසිරීමක් ඒ ආකාරයෙන්ම කර පෙන්වීම. | iii. රංග අභ්‍යාස |
| 09. | රංගනයට පෙර සූදානමකි. | iv. අනුකරණය |
| 10. | චරිතයක විවිධ පැතිකඩ | v. අභිනය |

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**

**(ආහාර්ය අභිනය , රූපණය , සජීවී බව , පරිකල්පනය , ඇඳුම් පැළඳුම්)**

11. නළුවා විසින් යම් චරිතයක් රංගනය කිරීම ................................... නම් වේ.

12. වේදිකා නාට්‍යයකදී වේෂභූෂණ යනුවෙන් හඳුන්වන්නේ ................................... ය.

13. නාට්‍ය සංගීතය අයත් වන්නේ ................................... ටයි.

14. ............................. වේදිකා නාට්‍යයක සුවිශේෂී ලක්‍ෂණයකි.

15. යමක් සිතින් මවා ගැනීම ................................... නම් වේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රකාශනයන් හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද වරහන තුළ යොදන්න.**

16. නාට්‍ය පෙළක අධ්‍යක්‍ෂ, නළු නිළියන් හා සෙසු ශිල්පීන් සඳහා ලබා දී ඇති උපදෙස් රංග විධාන නමින් හඳුන්වයි. (    )

17. විවිධ භූමිකාවලට අනන්‍ය වූ ස්වාධීන ලක්ෂණ ඇත. (    )

18. ආංගික අභිනය යනු නාට්‍යයක් සාර්ථක කර ගැනීමට බැහැරින් එකතු කර ගන්නා කලාංග වේ. (    )

19. පෞරුෂ වර්ධනය කර ගැනීමට යොදා ගත හැකි රංග අභ්‍යාසයක් ලෙස දර්පණ අභ්‍යාසය දැක්විය හැක. (    )

20. සමාරෝපයේ ප්‍රධාන කොටස් 4 කි. (    )

(ල.1 x 20 = 20)

## II කොටස

- **ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

1). (i). ආනුශංගික කලා යන්න හඳුන්වන්න. (ල.02)

(ii). ආනුශංගික කලා අංග තුනක් නම් කරන්න. (ල.03)

(iii). වේදිකා නාට්‍යයකට ආනුශංගික අංග භාවිතයේදී සැලකිලිමත් වියයුතු කරුණු සාකච්ඡා කරන්න. (ල.05)

2). (i). නාට්‍යයක ගැටුම යනු කුමක්ද ? (ල.02)

(ii). ගැටුමේ ප්‍රභේද තුනක් දක්වන්න. (ල.03)

(iii). එම ප්‍රභේද සඳහා කදා වළලු නාට්‍යයෙන් නිදසුන් සපයන්න. (ල.05)

3). (i). බෞද්ධ පූජා කර්ම යන්න හඳුන්වන්න. (ල.02)

(ii). බෞද්ධ පූජා කර්ම 3 ක් නම් කරන්න. (ල.03)

(iii). ඉන් එකක් හඳුන්වන්න. (ල.05)

4). (i). දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවෙකු නම් කරන්න. (ල.02)

(ii). ඔහුගේ නාට්‍ය නිර්මාණ 6 ක් නම් කරන්න (ල.03)

(iii). ඔහුගෙන් නාට්‍ය කලාවට සිදුවූ සේවය සාකච්ඡා කරන්න. (ල.05)

5). (i). දර්පණ අභ්‍යාසය සඳහා භාවිතා කරන වෙනත් නමක් ලියන්න. (ල.02)

(ii). දර්පණ අභ්‍යාසවල යෙදීමෙන් නළුවාට අත්වන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල.03)

(iii). පන්ති කාමරයේදී ඔබ දර්පණ අභ්‍යාසයේ නිරත වූ අයුරු කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

6). අසේල ඉගෙනීමට හා ක්‍රීඩාවට දක්ෂ, ආර්ථික අපහසුතා සහිත අහිංසක දරුවෙකි. දිනක් අසේලගේ බෑගය ශිෂ්‍ය නායකයින් විසින් පරීක්ෂා කරන විට..........................

ඉහත දැක්වෙන සිද්ධිය ඇසුරු කරගෙන නාට්‍ය පිටපතක් රචනා කරන්න.

(i). පසුබිම, කාලය, චරිත මැවීමට, රංග විධාන හා සංවාද සහිතව පෙළ රචනය (ල.03)

(ii). ගැටුම් සහිත අවස්ථා ගොඩනැගීම (ල.03)

(iii). නොසිතූ පෙරළියක් සහිත නිර්මාණශීලී නාට්‍ය නිමාවට (ල.04)